ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2184/45 - 2020 ජූලි මස 17 වැනි සිකුරාදා - 2020.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2009/FR/239.
*යොමු අංකය* : 3/3/6/2/13.

ජල පෝෂක ප්‍රදේශයක් ලෙස ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/පරවශතාවේ විස්තරය :*

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ ඉඹුල්පිටිය ගමේ පිහිටි මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මු.පි.මා 1812 දරන පිඹුරේ සඳහන් හෙක්ටයාර් 5.6869 ක් වූ කැබලි අංක 1 සහ 2 දරන ඉඩම් කැබලි:

1. කැබලි අංකය 1
ඉඩමේ නම: හුන්නස්ගිරිය වත්ත; මුල් හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.8424.

2. කැබලි අංකය 2
ඉඩමේ නම: හුන්නස්ගිරිය වත්ත; මුල් හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 4.8445.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.09.30 වැනි දින පෙ.ව. 10.00 ට උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020.09.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2020 ජූලි මස 13 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-859

1A - G 32510 - 32 (2020/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : අඹකෝ/3/5/අ/157.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ*
*යොමු අංකය* : 4-3/2/2013/FR/83.

උක්ත ශීර්ෂය යටතේ 2019.09.18 වැනි දිනැතිව අංක 2141/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියෙහි දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනය* | *ඉවත් කළ යුතු දිනය වෙනුවට ආදේශ කළ යුතු දිනය* |
|---|---|
| 2019 ඔක්තෝබර් 23 | 2020 ඔක්තෝබර් 21 |

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2020 ජූලි මස 13 වැනි දින,
අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-860

ශුද්ධිපත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ආර්ඩීඒ/එල්ඒ/සීඕඑල්/2013/08.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2014/එච්ඩබ්/304.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2150/4 හා 2019.11.18 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ පළ කර ඇති ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීමේ ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය 4-3/2014/එච්ඩබ්ලිව්/304 ලෙස සඳහන්ව ඇති අතර, එය පහත සඳහන් පරිදි නිවැරදි කරන බව මෙයින් දැනුම් දෙමි.

"ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/6/2014/එච්ඩබ්/304"

ඩී. එම්. දයාරත්න,
අධ්‍යක්ෂ (ඉඩම්) සහ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මාර්ග සංවර්ධන අධිකාරිය.

2020 ජනවාරි මස 23 වැනි දින,
ඉඩම් අංශය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
04 වන මහල, මගනැගුම මහමැදුර,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

07-861

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.